# පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය
## பாராளுமன்றச் சபை முதல்வரின் அலுவலகம்
## OFFICE OF THE LEADER OF THE HOUSE OF PARLIAMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| දිනය<br>திகதி<br>Date | 2022.06.10 | මගේ අංකය<br>எனது இலக்கம்<br>My No | LHP/PA/01-2022/Reports | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | |

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
සියලුම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්
අනෙකුත් විශේෂ වියදම් ඒකක ප්‍රධානීන්

<u>පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක: LHP/PA/01-2022/Reports හා 2022.03.30 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

වර්තමානයේ රටේ පවතින තත්ත්වය මත මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය කඩදාසි වල ඇති හිඟතාවයන් හා සංයුක්ත තැටි වැනි ආනයනික අමුද්‍රව්‍ය විශාල ලෙස වෙළඳපොලෙන් සපයා ගැනීම අපහසු වීම පිළිබඳව මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MF5/PA/2021/Parliament/01 හා 2022.05.12 දිනැති ලිපිය මඟින් කරන ලද කරුණු දැක්වීම සම්බන්ධයෙන් 2022.06.02 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදුව පාර්ලිමේන්තුව වෙත ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිත වාර්තා හා දෘඪ තැටි පිටපත් අවම ප්‍රමාණයකින් යොමු කිරීම සුදුසු බව තීරණය කරන ලද අතර ඒ බව ගරු කථානායකතුමා විසින් 2022.06.07 දින සභාගර්භයේදී නිවේදනය කරන ලදී.

ඒ අනුව පාර්ලිමේන්තුවේ නෛතික අවශ්‍යතාවයන් ද සැලකිල්ලට ගනිමින් ඉදිරියේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්තා පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් මුද්‍රිත පිටපත් හා සංයුක්ත තැටි ලෙස ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

| වාර්තාවේ නම | ත්‍රෛයිභාෂාවෙන් අවශ්‍ය මුද්‍රිත පිටපත් සංඛ්‍යාව | ත්‍රෛයිභාෂාවෙන් සකස් කළ සංයුක්ත තැටි සංඛ්‍යාව (CD/DVD) | |
|---|---|---|---|
| කාර්ය සාධන වාර්තා | 12 | 02 | සිංහල,දෙමළ,ඉංග්‍රීසි භාෂා |
| වාර්ෂික වාර්තා | 12 | 02 | අනුපිළිවෙලින් එක් එක් භාෂාව සඳහා |
| 119 (4) හා 120(4) යටතේ වාර්තා | 12 | 02 | වෙන් වෙන් ව සකස් කරන ලද PDF |
| වෙනත් වාර්තා | 12 | 02 | ගොනු 3 ක් වශයෙන් |

කෙසේ වුවද මේ වන විටත් තම වාර්තා පාර්ලිමේන්තුව වෙත ලබා දීම සඳහා මුද්‍රණ කටයුතු අවසන් කර ඇති ආයතනයන් හට ඒ අයුරින්ම එම වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට හැකි බව දන්වන අතර උක්ත පිටපත් සංඛ්‍යාවන් මුද්‍රණය කිරීමේ දී අවම පිරිවැයක් දරමින් එම කටයුතු සිදු කරන මෙන් ද තවදුරටත් දන්වා සිටිමි.

පාර්ලිමේන්තුව වෙත ඇතැම් ආයතන විසින් එවනු ලබන සංයුක්ත තැටි වල වෛරස් අඩංගු වී ඇති බව වාර්තා වන අතර එවන් අවස්ථාවන් හි දී එම සංයුක්ත තැටි භාර ගැනීම පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන බැවින් පරිගණක වෛරස් වලින් තොර සංයුක්ත තැටි එවීමට කටයුතු කරන මෙන් ද දන්වා සිටිමි.

මේ පිළිබඳව ඔබ කාර්යාලය යටතේ පවතින දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන දැනුවත් කිරීමට කටයුතු කරනු ඇතැයි කාරුණිකව අපේක්ෂා කරමි.

හර්ෂ විජේවර්ධන
පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්


ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ. / இலங்கை பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே. / Parliament of Sri Lanka, Sri Jayewardenepura Kotte.

ලේකම් / செயலாளர் / Secretary — ☎ : 011-2 777 463 ; Fax : 011-2 777 464 ; @ : secretary@olhp.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office — ☎ : 011-2 777 448/ 011-2 777 467 ; Fax : 011-2 777 468 ; Web : www.olhp.gov.lk